ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/SD/GS/උපදෙස් පත්‍රිකා

2017 අගෝස්තු මස 18 වන දින

තිරසර සංවර්ධන අංශය

**ග්‍රාමශක්ති උපදෙස් පත්‍රිකා අංක 02 (පෞද්ගලික අංශයේ සහයෝගීතාව)**

**සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු / සියලුම දිස්ත්‍රික් ලේකම්වරු,**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,**

<u>ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයට සම්බන්ධ රජයේ නිලධාරින් විසින් සිදුකළ යුතු කටයුතු පැහැදිලි කිරීම</u>

ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ එක් ප්‍රධාන කොටසක් වන පෞද්ගලික අංශයේ සහයෝගීතාව සමග ගම සම්බන්ධ කරමින් ක්ෂුද්‍ර ආර්ථික සමාගම්, ගම තුළ ගොඩනැගීම සඳහා අවශ්‍ය කටයුතු සැකසීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඔබේ අවධානය යොමු කරවමි.

1. උපදෙස් පත්‍රිකා අංක (01) තුළ ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීම.
2. වැඩසටහන පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් ට පැහැදිලි කිරීම (අත් පත්‍රිකා/ සංකල්ප පත්‍රිකා උපයෝගී කර ගන්න).
3. නිෂ්පාදන ගම්මානවලට සම්බන්ධ, සංවර්ධන නිලධාරින්ට අවශ්‍ය පුහුණුව ලබා දීම.
4. ප්‍රාදේශීය ලේකම් විසින් නිෂ්පාදන ආර්ථික ගම්මාන ලෙස තෝරා එවන ලද ගම්මාන වෙත දැනුම් දීම (ඔවුන් තෝරා ගත් බව).
5. එකී ගම්මානවල ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ගම මූලික කර ගනිමින් ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන සැලසුම / සැලසුම් සකස් කිරීම (නිෂ්පාදන භාණ්ඩ හෝ සේවා පදනම් කර ගනිමින්) (Micro Business Development Plan) ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික සහය, ග්‍රාමශක්ති ප්‍රධාන කාර්යාලය සම්බන්ධ කර ගනිමින් ලබා ගත හැකිය.
6. ව්‍යාපාර සැලසුම සකස් කරන අවස්ථාවේ දී උපදේශනය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය සමග ව්‍යවසාය අදහස් සම්බන්ධ කිරීම.
7. තෝරාගත් ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුළ ව්‍යාපාර සැලැස්ම අනුව හඳුනා ගත් නිෂ්පාදන මුල්කර ගනිමින් සමාගම් ලියාපදිංචි කිරීම. ක්ෂුද්‍ර සමාගම ලියාපදිංචි කිරීමේ දී ග්‍රාමශක්ති කාර්යාලය විසින් ලබා දී ඇති විස්තර පත්‍රිකාව අනුගමනය කරමින් එය සිදු කිරීම (කණ්ඩායම්/පුද්ගල).

ජයන්ත විජේරත්න
ජනාධිපති අතිරේක ලේකම්
ජනාධිපති ලේකම් වෙනුවට

පිටපත : ජනාධිපති ලේකම් : කාරුණික දැන ගැනීම සඳහා
ලේකම් : ස්වදේශ කටයුතු අමාත්‍යාංශය: කාරුණික දැන ගැනීම සඳහා
ලේකම් : පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය : කාරුණික දැන ගැනීම සඳහා

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones 011 2354354, 011 4354354
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2340340
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail ps@presidentsoffice.lk